**(රාජ්‍ය / අර්ධ රාජ්‍ය නිලධාරීන් / බාහිර පුද්ගලයින් සඳහා)**

**අවසාන දිනය - 2026.07.17**

# ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන **"මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියෙහි (CEP 1)"** පහත තනතුරු සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය නිලධාරීන් ඇතුළු ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මාර්ග ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) මූලික වශයෙන් කොළඹ නගරයේ පිහිටුවා ඇත.

මෙම පත්වීම් මුදල් අමාත්‍යාංශය විසින් 2026.03.28 දින නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 හි විධිවිධානවලට යටත් වේ.

- **ව්‍යාපෘතියේ නම - මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (CEP 1)**
  **(ඇ.ඩො.මිලියන 200 ට වැඩි කාණ්ඩය)**

| ව්‍යාපෘති වටිනාකම (ඇ.ඩො.මිලියන) | ව්‍යාපෘතියේ නම | තනතුරු නාමය | කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026 ට අනුව වැටුප් කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ඇමරිකානු ඩොලර් මිලියන 200 ට වැඩි හෝ ඊට සමාන කාණ්ඩයක් | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (CEP 1) | මූල්‍ය සහකාර | සහායක කාර්ය මණ්ඩලය MN 2/ MN 4-2025 | 01 |
| | | රියදුරු | සහායක කාර්ය මණ්ඩල PL 03 - 2025 | 03 |

**<u>ඉහත සඳහන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 2/2026 ට අනුව, මූල්‍ය සහකාර (සහායක කාර්ය මණ්ඩලය) MN 4-2025 / MN 2-2025 මූලික සුදුසුකම් පහත දැක්වේ.</u>**

## 01. <u>මූල්‍ය සහකාර (MN-4 - 2025)</u>

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සාර්ථකව නිම කරන ලද අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

සහ

- අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක පළපුරුද්ද (එකම තනතුර)

**02. <u>මූල්‍ය සහකාර (MN-2 - 2025)</u>**

- අ.පො.ස. (සා.පෙළ) විභාගය, භාෂාව සහ ගණිතය ඇතුළුව තවත් විෂයන් දෙකක් සඳහා සම්මාන සාමාර්ථ හතරක් (4)ක් සහිතව විෂයයන් හයකින් (6) එකවර සමත් වී තිබීම.

සහ

- අ.පො.ස. (උ.පෙළ) විභාගයේ වාණිජ විෂය ධාරාව යටතේ සියලුම විෂයයන් එකවර සමත් වී තිබීම.

සමඟ

- අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක පළපුරුද්ද (එකම තනතුර)

**<u>ඉහත සඳහන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 2/2026 ට අනුව, රියදුරු PL 03 -2025 (සහායක කාර්ය මණ්ඩලය) මූලික සුදුසුකම් පහත දැක්වේ.</u>**

- අ.පො.ස. (සා/පෙළ) විභාගය, භාෂාව ඇතුළුව තවත් විෂයයකට සම්මාන සාමාර්ථ දෙකක් (2) සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකින් පෙනී සිටිමින් විෂයයන් හයකින් (6) සමත් වී තිබීම

සහ

- රියදුරු බලපත්‍රය - වාහන කාණ්ඩ C සහ C1

හෝ

- නව රියදුරු බලපත්‍රයේ B කාණ්ඩය

සහ

- වසර 3 ක පළපුරුද්ද

**<u>පොදු කොන්දේසි:</u>**

- බඳවා ගැනීම්, වැටුප්, ප්‍රතිලාභ සහ අනෙකුත් සේවා කොන්දේසි, මුදල් අමාත්‍යාංශය විසින් 2026.03.28 දින නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 හි දක්වා ඇති විධිවිධානවලට අනුකූල වේ.
- තෝරා ගැනීම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ අනෙකුත් චක්‍රලේඛ කොන්දේසි මත පදනම් වේ.
- සියලුම අයදුම්පත් මෙම චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතියට අනුව පුරවා අදාළ ලේඛනවල සියලුම පිටපත් යැවිය යුතුය.
- එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- අපේක්ෂකයින් තෝරා ගනු ලැබුවහොත් ප්‍රදේශයේ සහ/හෝ රටේ ඕනෑම ස්ථානයක වැඩ කිරීමට එකඟ විය යුතුය.

01. **වයස් සීමාව:**

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය නිලධාරීන් සඳහා අවුරුදු 60 ට අඩු
- අනෙකුත් අය සඳහා අවුරුදු 64 ට අඩු

## 02. වැටුප:

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 මත පදනම්ව වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

## 03. රැකියා කොන්දේසි:

- මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත ලබාදෙන අතර, ආරම්භයේදී වසරක කාලයක් සඳහා ලබා දේ. සේවා අවශ්‍යතාවය සහ කාර්ය සාධනය මත පදනම්ව සේවය දීර්ඝ කිරීම සලකා බැලිය හැකිය.

- අයදුම්කරු දැනටමත් පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන්ම රජය සතු සමාගම් ඇතුළුව රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන්නේ නම්, මෙම පත්වීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026 හි 2.3.3 ඡේදයේ සඳහන් කර ඇති නිදහස් කිරීමේ පදනම සහ සලකා බැලීමේ නිවැරදි නිදහස් කිරීමේ පදනම මත පදනම් වේ.

- අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර නොමැති සහ අයදුම්පත සමඟ නිවැරදි දත්ත ඉදිරිපත් කර නොමැති අපේක්ෂකයින් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 හි නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් සහ අනෙකුත් අවශ්‍යතා සපුරා නොමැති අපේක්ෂකයින් පත්වීම් සඳහා සලකා බලනු නොලැබේ.

- පත්වීම ලබා දීම හෝ ලබානොදීම හෝ සේවය දීර්ඝ කිරීමේ තීරණය චක්‍රලේඛ සහ අනෙකුත් විධිවිධාන අනුව අමාත්‍යාංශ ලේකම්වරයාගේ තීරණය මත සිදු කෙරේ.

## 04. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන්ම රජය සතු සමාගම් ඇතුළුව රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දැනටමත් දරන අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා හරහා සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 02/2026 හි 2.3.3 ඡේදයට අනුව නිත්‍ය තනතුරෙන් නිදහස් කිරීමේ කැමැත්ත සහ නිදහස් කිරීමේ පදනමේ නිර්දේශය සහිතව එවිය යුතුය. (එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

## 05. අයදුම්පත ඉදිරිපත් කිරීම

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අධ්‍යයන සුදුසුකම් පිළිබඳ විස්තර, මූලික උපාධියේ පිටපත, සේවා පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු සමඟ, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ලියා ඇති දැන්වීමේ දැක්වෙන තනතුරේ සහ ව්‍යාපෘතියේ නම සඳහන් කරමින්, ලියාපදිංචි තැපෑලෙන් පහත දක්වා ඇති ආකෘතියට අනුව, **ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය, "මගනැගුම මහමැදුර", අංක: 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ලිපිනයට හෝ 2026.07.17 දින හෝ ඊට පෙර අමාත්‍යාංශ පරිපාලන අංශයට ගෙනැවිත් භාර දිය යුතුය.**

## 06. විශේෂ අවධානය සඳහා

- **ලබා දී ඇති ආකෘතියට අනුකූලව නිසි ලෙස පුරවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

- **අයදුම්පත සමඟ සහතික පිටපත් ඉදිරිපත් කළ සුදුසුකම් පමණක් තෝරා ගැනීම සඳහා සලකා බලනු ලැබේ.**

**07. ඕනෑම විමසීමක් සඳහා කරුණාකර අමතන්න - 011-2271048**

**08. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කරන ලද මෙම දැන්වීමේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, සිංහල දැන්වීමේ ඇති කරුණු බලපැවැත්විය යුතුය.**

සහායක කාර්ය මණ්ඩලය සඳහා අයදුම්පත් ආකෘතිය - ඇමුණුම 1

**ලේකම්**
**ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය**